**කල්පිටිය ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**---------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2016 මාර්තු 24 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 27 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 20 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනයකළ මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කල්පිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**---------------------------------------**

**1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි ඒකක 24 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීම හා රු.36,000 ක් වූ කැමරා දෙකක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කර නොතිබුණු අතර, වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබූ මුද්දර ගාස්තු ලැබීම් රු.18,342,613 ක් සහ එකතුව 17,756 ක් වූ දුරකථන හා විදුලි බිල්පත් ණය හිමියන් යටතේ දක්වා නොතිබුණි.

(ආ) ගෙවීම් ණයහිමියන් තිදෙනෙකුගේ ප්‍රතිපාදන රු.148,356 ක් වැඩියෙන් හා ණයගැතියන් දෙදෙනෙකුට අදාල රු.9,975 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) ඉටුනොකරන ලද ව්‍යාපෘති 26 ක රු.5,014,975 ක ප්‍රතිපාදන කර්මාන්ත ණයහිමියන් ලෙස ගිණුම් ගතකර තිබුණි.

**1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>**

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.16,527,949 ක් වූ අතර, උපලේඛන අනුව එම ශේෂය රු.16,261,852 ක් වුයෙන් වෙනස රු.266,097 ක් විය.

**1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම්වල වටිනාකම රු. 53,667,468 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම්වල වටිනාකම රු.30,580,052 ක් විය. එයින් වර්ෂයකට වඩා ලැබිය යුතු ගිණුම් රු.17,358,386 ක් ද, වර්ෂ 03 ක් ඉක්මවූ ගෙවිය යුතු ගිණුම් රු.13,188,762 ක් ද විය.

**(ආ) <u>සේවක ණය</u>**

2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.4,319,572 ක් වූ අතර, අවුරුදු 07 කට වඩා වැඩි කාලයක් තිස්සේ හිඟහිටි ශේෂවල එකතුව රු.138,041 ක් විය.

**1.3.4** <u>විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.113,663,673 ක් වූ ගිණුම් ශේෂ විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5** <u>**නීති, රීති, රෙගුලාසි හා විධි විධාන ආදියට අනුකූල නොවීම්**</u>

නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129 (2) (අ) සහ (ඊ) වගන්ති ප්‍රකාරව ලැබිය යුතු වරිපනම්, බදුකුලී, බලපත්‍ර ගාස්තු, උසාවි දඩ හා මුද්දර ගාස්තු රු.45,194,021 ක් අයකර ගෙන නොතිබූ අතර, පනතේ 150 (4) වගන්තිය ප්‍රකාරව බලප්‍රදේශයේ ව්‍යාපාරික ස්ථානවලින් බලපත්‍ර ගාස්තු නොගෙවන්නන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව 1989 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා නිලධාරීන්ට ලබාදී තිබූ එකතුව රු.278,087 ක තත්කාර්යය අතුරු අග්‍රිමයන් (අත්තිකාරම්) අදාල වර්ෂ තුළදී නිරවුල් කිරීමට සහ මුදල් රෙගුලාසි 571 අනුව වසර 2 ක් ඉක්මවන ලද රු.1,425,879 ක් වටිනා තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ ගණනාවක සිට අයකර ගෙන තිබූ රු.289,387 ක භාණ්ඩ හා සේවා බදු, රු.4,326,351 ක එකතු කල අගය මත බදු සහ රු.53,221 ක ජාතිය ගොඩනැඟීමේ බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යවා නොතිබුණි.

**2.** **මූල්‍ය සමාලෝචනය**

---

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.23,005,549 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,991,395 ක් විය.

**2.2** **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

---

සමාලෝචිත වර්ෂය තුළ පුනරාවර්තන වියදම් සඳහා අයවැයෙන් වෙන්කර තිබූ ප්‍රමාණයෙන් සියයට 33 ක් උපයෝජනය කර තිබූ අතර, රුපියල් මිලියන 31ක් වූ මුළු ප්‍රාග්ධන වියදමින් උපයෝජනය කරගෙන තිබුණේ රුපියල් මිලියන 25ක් හෙවත් සියයට 80 ක් පමණි.

**2.3** **ආදායම් පරිපාලනය**

---

**2.3.1** **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

---

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී සභාව විසින් හිඟ ආදායම් හා බිල්කල ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය පහත පරිදි විය.

| ආදායම් ශීර්ෂය | 2015.01.01 දිනට හිඟ ආදායම | හිඟයෙන් අයවීම | හිඟ මුදල් අයවීමේ ප්‍රගතිය | වර්ෂය තුළ බිල්කල ආදායම | බිල්කල ආදායමින් අයවීම | අයවීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | % | රු. '000 | රු. '000 | % |
| වරිපනම් හා අක්කර බදු | 7,992 | 1,206 | 15 | 1,818 | 413 | 23 |
| බදුකුලී | 4,046 | 2,035 | 50 | 2,374 | 144 | 06 |
| බලපත්‍ර ගාස්තු | 75 | 4 | 05 | 2,118 | 2,118 | 100 |
| වෙනත් ආදායම් | 4,858 | 178 | 04 | 3,118 | 2,978 | 96 |

**2.3.2 වරිපනම් බදු**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 ජනවාරි 01 දිනට හිඟය රු.7,277,733 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම් රු.1,754,803 ක් සමඟ අයවියයුතු මුදල රු.9,032,536 ක් විය. ඉන් රු.1,582,285 ක් අයකර ගෙන තිබූ අතර, වර්ෂය අවසානයට මුළු හිඟය රු.7,450,251 ක් හෙවත් ප්‍රතිශතයක් ලෙස සියයට 18 ක් වී තිබුණි.

(ආ) බලප්‍රදේශයේ ගොඩනැඟිලි අලුතින් ඉදිකිරීම හෝ පවත්නා ගොඩනැඟිලි වැඩිදියුණු කිරීමට සැලැසුම් අනුමත කිරීමෙන් පසු අනුකූලතා සහතික නිකුත් කර තිබූ ගොඩනැඟිලි සහිත ඉඩම්වල වරිපනම් බදු සංශෝධනය කර නොතිබුණි.

**2.3.3 බදු කුලී**

2015 ජනවාරි 01 දිනට හිඟ බදු කුලී රු.8,460,925 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ බිල්කිරීම් රු.5,445,538 ක් වූයෙන් අයකර ගතයුතු මුදල රු.13,906,463 ක් විය. ඉන් සමාලෝචිත වර්ෂය තුළ රු.6,549,593 ක් හෙවත් ප්‍රතිශතයක් ලෙස සියයට 47 ක් අයකර ගෙන තිබුණි.

**2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

2015 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා ප්‍රධාන ලේකම් වෙත යවා ඇති රු.1,020,081 ක උසාවි දඩ මුදලින් රු.720,081 ක් 2016 පෙබරවාරි මාසයේදී ලැබී තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.18,342,613 ක මුද්දර ගාස්තුවලින් රු.13,042,663 ක් 2016 පෙබරවාරි සහ මැයි මාසවලදී ලැබී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට රු.282,124 ක අත්තිකාරම් පියවා නොතිබූ අතර, ඉන් වසර 02 ඉක්ම වූ අත්තිකාරම් වටිනාකම රු.280,124 ක් විය.

(ආ) අංක 0002890535 දරන ජංගම ගිණුමේ බැංකු සැසඳුම් ප්‍රකාශවල සභාවේ උප කාර්යාලවල අත ඉතිරිය ලෙස භෞතිකව නොපවතින එකතුව රු.18,667 ක ශේෂයක් දිගින් දිගටම පෙන්නුම් කර තිබුණි.

(ඇ) සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් ප්‍රමාද කර ගෙවීම හේතුවෙන් පනවා තිබූ රු.6,749 ක අධිභාර සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් අරමුදලට රු.1,951,770 ක මුදලක් ගෙවීමට තිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

---

**4.1 විගණන හා කළමනාකරණ කමිටු**

---

වයඹ ප්‍රධාන ලේකම්ගේ 2010 ඔක්තෝබර් 05 දිනැති අංක ව/ප්‍ර/ලේ/05/03 විගණන කමිටු දරන ලිපියට අනුව විගණන කළමනාකරණ කමිටු රැස්වීම් කාර්තුවකට එක බැගින් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ කිසිදු රැස්වීම් වාරයක් පවත්වා නොතිබුණි.

**4.2 පරිසර සංරක්ෂණය**

---

සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ආරම්භ කර තිබුණ ද, වෙළඳපොලට සරිලන පරිදි කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයක් සැපයීමට සභාව අපොහොසත් වී තිබුණි.

**4.3 වත්කම් කළමනාකරණය**

---

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---

වාහන 08 ක් වර්ෂ 01 ත්, 07 ත් අතර, කාල පරාසයක් තුළ භාවිතයෙන් ඉවත්කිරීම නිසා නිෂ්ක්‍රීයව තිබුණු අතර, එයින් වාහන 06 ක වටිනාකම රු.1,719,515 ක් ලෙස තක්සේරු කර තිබුණි.

**(ආ) වාර්ෂික සමීක්ෂණය**

---

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකර සභා දේපලවල අයිතිය තහවුරු කරගෙන නොතිබු අතර, ඉකුත් වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව පුස්තකාල පොත් 222 ක් අස්ථානගතවී තිබුණි. ඒවායේ වටිනාකම් වගකිවයුත්තන්ගෙන් අයකර ගැනීමට නිර්දේශ කර තිබුණද, ඒ අනුව, කටයුතු කර නොතිබුණි.

**(ඇ) මානව සම්පත් කළමනාකරණය**

---

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---

වසර කිහිපයක් තිස්සේ සභාවේ ලේකම් තනතුර පුරප්පාඩුව පැවති අතර, ද්විතියික හා ප්‍රාථමික තනතුරු 11 ක පුරප්පාඩු පැවතුණි. ද්විතියික හා ප්‍රාථමික ශ්‍රේණිවල තනතුරුවල ස්ථිර සේවයට 28 දෙනෙකු බඳවාගෙන 2015 වර්ෂයේ වැටුප් ගෙවා තිබූ අතර, ඉන් රු.8,843,541 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුව (වයඹ) ප්‍රතිපූර්ණය කර නොතිබුණි. පුරප්පාඩු සම්පූර්ණ කළේ නම් ඒ සඳහා සභාව විසින් දැරූ වියදම් ප්‍රතිපූර්ණය කරගත හැකි බැවින්, සභාවට මෙම වියදම් ඉතිරි කරගත හැකිව තිබුණි.

**5.** **පද්ධති හා පාලන**

**-------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් පරිපාලනය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) ගිණුම්කරණය

(ඇ) වාහන පාලනය